# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

තෙවන වාර පරීක්ෂණය - 2022(2023)
**Third Term Test – 2022(2023)**

1621

| 6 ශ්‍රේණිය Grade 6 | ඉතිහාසය I - II | කාලය පැය 2 යි |
|---|---|---|

i කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01) ක්‍රිස්තු වර්ෂ 4 වන සියවසේදී රචනා කරන ලද සාහිත්‍ය මූලාශ්‍රයක් වන්නේ ...........................යි.

(මහාවංශය/ දීපවංශය /ථූපවංශය )

02) ශ්‍රී ලංකාවේ අක්ෂර භාවිතය පිළිබඳ අවුරුදු ..................................................පමණ ඉතිහාසයක් තිබේ.

( දෙදහස් දෙසිය පනහක/ දෙදහස් තුන්සිය පනහක /තුනදහස් දෙසිය පනහක)

03) "හැකි මිනිසා" යන නමින් හැඳින්වූ මානවයා...........................................ය.

( හෝමෝසාපියන් /හෝමෝ ඉරෙක්ටස් /හෝමෝ හැබිලස් )

04) ඊජිප්තු වැසියන් විසින් භාවිත කරන ලද අක්ෂර හැඳින්වෙන්නේ ඊජිප්තු............................................. නමිනි

(චිත්‍රාක්ෂර /කූන්‍ය අක්ෂර /රූපාක්ෂර)

05) නගරයක් අසල පළමුවරට වැවක් ඉදි කරන ලද්දේ ....................................................................... රජතුමා විසිනි.

(වසභ/ පණ්ඩුකාභය / දේවානම්පියතිස්ස)

- **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√ ) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුල ලියන්න.**

06) බුද්ධ වර්ෂ ආරම්භ වන්නේ බුදුන් වහන්සේගේ පරිනිර්වාණය වූ දින සිටය. ( )

07) මහා හිම යුගය ආරම්භ වන කාලයේ කැනඩාවේ චිම්පන්සීන් වර්ගයක් අනෙක් අයට වඩා වෙනස් ආකාරයකට හැඩ ගැසුණි. ( )

08) මිනිසුන් ආගමික කටයුතුවලට නැඹුරුවීම පළමුවරට පිළිබිඹු වන්නේ මධ්‍ය ශිලා යුගයේ දී ය ( )

09) ගොවිතැන් කිරීමට පුරුදු වූ මෙරට පැරණිතම ජනතාව ජීවත් වූයේ කඳුකර ප්‍රදේශවල ය. ( )

10) අනුලා දේවිය පැවිදි වීමෙන් පසු මෙරට මෙහෙණි සසුන ආරම්භ විය ( )



LIVEWORKSHEETS

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන වචනය ලියන්න.**

11) පළමුවරට ගොඩබිම පහළ වූ පාද කිහිපයක් සහිත හැකරැල්ලන් වැනි සතුන් ව්‍යාප්ත වූ යුගය හැඳින්වෙන්නේ ...................................................................... යුගය නමිනි.

12) වෘත්තයකට අංශක 360 ක් ඇති බව සොයාගත් ගණිතඥයන් සිටියේ............................... ශිෂ්ටාචාරයේ ය.

13) විජය කුමරු ඇතුළු පිරිස් මෙරටට ගොඩබට ස්ථානය ..................................................නමින් හැඳින්වේ.

14) මිහිඳු හිමියන් ඇතුළු පිරිසට වාසය කිරීම සඳහා පූජා කළ ගල් ගුහා ..................................නමින් හැඳින්වේ.

15) ...............................................................රජතුමා මින්නේරි දෙවියන් යන අන්වර්ථ නාමයෙන් හඳුන්වයි .

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි ම පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16) මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණි ම වානරයා හැඳින්වෙන්නේ කිනම් නමකින් ද?

1. හෝමෝ හැබිලස් 2. හෝමෝ ඉරෙක්ටස් 3. හෝමෝසාපියන් 4. ඔස්ට්‍රලෝපිතිකස්

17) දුප්පත් පොහොසත් යන බෙදීමක් මුල්වරට ඇතිවූයේ,

1. මධ්‍ය ශිලා යුගයේ දී ය. 2. පුරාශිලා යුගයේ දී ය.
3. නව ශිලා යුගයේ දී ය. 4. නව මධ්‍ය ශිලා යුගයේ දී ය.

18) මොහෙන්ජොදාරෝ, හරප්පා යන නගර අයත් ශිෂ්ටාචාරය කුමක් ද?

1. ඉන්දු නිම්න 2. මායා 3. චීන 4. ඊජිප්තු

19) ත්‍රිපිටකය පොත්පත්වල ලිවීම ආරම්භ වූයේ කිනම් රජුගේ රාජ්‍ය කාලයේදී ද?

1. වසභ 2. වළගම්බා 3. දුටුගැමුණු 4. මහසෙන්

20) ධාතුසේන රජු විසින් කරවන ලද වාරි තාක්ෂණයක් වන්නේ ,

1. කලා වැව යි 2. තිසා වැව යි 3. අභය වැව යි 4. මින්නේරි වැව යි

(ල. 2×20=40)



LIVEWORKSHEETS